# හරිත කව ව්‍යාපෘතිය - 2009

## බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ විදි අලංකරණය හා රේඛිය උද්‍යාන ව්‍යාපෘතියේ නිල සමාරම්භක උත්සවය

පරිසර පද්ධතින් හට වටිනා සේවාවක් සපයමින් පොළව මතුපිට වකුගඩු වශයෙන් තෙත්බිම් සලකනු ලබයි. ඉහල ජෛව විවිධත්ව වටිනාකමකින් යුත් මෙවැනි තෙත්බිම් ශාක හා සත්ව විශේෂ ගණනාවකින්ම ගහන වේ. ශාක හා සත්ව විශේෂ ආහාර සපයා ගැනිම සඳහාද ඔවුන්ගේ බෝවිම සඳහාද මෙම තෙත්බිම් මහෝපකාරි වෙයි. ඊට අමතරව මෙවැනි තෙත්බිම් මහජනතාවගේ සෞන්දර්යාත්මක කටයුතු සඳහාද වක්‍රව ප්‍රයෝජනවත් වේ. අවසනාවන්ත ලෙස මෙම වටිනා පරිසර පද්ධතින් මානව ක්‍රියාකාරකම් නිසා විනාශ විමට ලක්වි ඇත. මෙලෙස විවිධාකාරයෙන් තර්ජනයට ලක්ව ඇති පරිසර පද්ධතියක් වන තෙත්බිම් අනාගත පරපුර සඳහා සංරක්ෂණය කිරීමේ අරමුණ ඇතිව **"පියකරු පුරවරයක් උදෙසා - නාගරික තෙත්බිම් සුරැකීම"** දැක්ම කර ගනිමින් පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය විසින් හරිත කව ව්‍යාපෘතින් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ පරිපාලන නගරයක් වන බත්තරමුල්ල ආශ්‍රිතව කොස්වත්ත කන්දෙවත්ත තෙත්බිමට යාබද මාර්ගය වන ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත මෙම හරිත කව ව්‍යාපෘතින් ක්‍රියාත්මක කෙරේ.

කොස්වත්ත කන්දෙවත්ත තෙත්බිමට යාබද මාර්ගය වන ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ රාජ්‍ය ආයතන ගණනාවක්ම පිහිටා තිබෙන අතර දෛනිකව මෙම ආයතනවල සේවය ලබා ගැනිමේ අරමුණින් බෝහෝ ජනතාවක් ඒකරාශිවේ. මේ නිසා මෙම තෙත්බිම් යාබද මාර්ගයේ අනිසි ලෙස කසළ බැහැර කිරීම හා දෛනිකව එන මගින්ගේ වාහන නවතාලීමේ ක්‍රමවත් බවක් දක්නට නොලැබේ. එහෙයින් හරිත කව ව්‍යාපෘතියේ පලමු අදියර වශයෙන් ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත ආශ්‍රිතව පාරිසරික වටිනාකමක් මෙන්ම සෞන්දර්යාත්මක වටිනාකමක් ලබා දෙමින් මෙම තෙත්බිම් ආශ්‍රිත මාර්ගය සංරක්ෂණය කිරිම ඉතා අත්‍යාවශ්‍ය වූවකි.

ඒ අනුව පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ විදි අලංකරණය හා රේඛිය උද්‍යාන පිළිබඳවූ හරිත කව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. කොස්වත්ත හන්දියේ සිට පාලම් තුන හන්දිය දක්වා ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය මගින් විධිමත් මංතීරු සකස් කරීමත් විදි අලංකරණය සඳහා අවශ්‍යවන්නාවූ විදුලි ලාම්පු හා කසළ බහාලන බඳුන් යෙදීමත් මගින් ක්‍රමවත් අයුරින් මාවත අලංකරණය කිරීමටත් අපේක්ෂිතය. තවද මෙමඟින් මහජනතාවට පරිසරය රසවිඳිමට හැකිවන පරිදි ශාරීරික අභ්‍යාස කටයුතුවල යෙදිම සඳහා රේඛිය උද්‍යානයක් සකස් කර එය නාගරික අලංකරණය සඳහා යොදා ගැනිමටත් බලාපොරොත්තු වේ. ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත දෙපස පිහිටා තිබෙන්නාවූ රාජ්‍ය ආයතන වලට සේවාවන් ලබා ගැනිමේ අරමුණින් දෛනිකව පැමිණෙන සේවාලාභින්ගේ වාහන නැවතිමේ පහසුකම් ක්‍රමවත් අයුරින් සකස් කිරීමට අපේක්ෂිතය.

**2009 අගෝස්තු මස 27 දින මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු නිල වශයෙන් ගරු පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලද** අතර මේ සඳහා රාජ්‍ය ආයතනවල නිලධාරින් , ප්‍රදේශවාසීන් එම අවස්ථාව සඳහා රැසිව සිටියහ. එහි වැඩ කටයුතු රණාල ගාමිණී කන්ස්ට්‍රක්ෂන් කොන්ත්‍රාත් ආයතනයට නිල වශයෙන් භාරදී ඇත. මෙහි ව්‍යාපෘති සැලසුම් නිර්මාණය නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදුකෙරේ. 2009 වසර සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාව අනුව හරිත කව ව්‍යාපෘතිය සඳහා මුල්‍යමය ප්‍රතිපාදන පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය වෙත වෙන් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල රුපියල් මිලියන 58.42 කි.

තිරසර පරිසර අංශය
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය
2009 ජුනි